www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති බලයට පැනගැනීමේ ව්‍යායාමයක

## Former Sri Lankan president makes bid for power

**සමන් ගුනදාස විසිනි**
**2015 ජුලි 23**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) හා එහි පාර්ලිමේන්තු කන්ඩායමේද එක්සත් ජනතා නිදහස් සංධානයේද (එජනිස) නායකයන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ අගෝස්තු 17 මහ මැතිවරනයේදී ඔවුන්ගේ අගමැති අපේක්ෂකයා ලෙස නම් කලේය. එය ප්‍රකාශයට පත් කලේ පසුගිය සිකුරාදා අනුරාධපුරයේදී පැවති එජනිසයේ ප්‍රථම නිල මැතිවරන රැලියේදීය.

මෙම නිවේදනය මීට දින හතරකට පෙර ශ්‍රීලනිප හා එජනිසයේද නායකයා වූ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන පොරොන්දු දුන් පරිදි, පක්ෂය පාර්ලිමේන්තුව තුල බහුතරයක් දිනා ගත්තද රාජපක්ෂට අගමැති තනතුර ලබා ගැනීමට තමන් ඉඩ නොදෙන්නේය යන ප්‍රකාශය විවෘතව ප්‍රතික්ෂේප කිරීමකි.

තම දේශපාලන විරුද්ධවාදියාට එරෙහිව ජනාධිපති ලෙස සිය විධායක බලතල පාවිච්චි කිරීමට සිරිසේනගේ සූදානම, නොයෙකුත් ඉහල මධ්‍යම පන්තික කොටස් හා ව්‍යාජ වාම සංවිධාන සඳහන් කරන ආකාරයට වත්මන් ජනාධිපති "ප්‍රජාතන්ත්‍රවාදය" හා "යහ පාලනය" වෙනුවෙන් පෙනී සිටින්නේය යන ප්‍රෝඩාව එලිදරව් කරයි.

සිරිසේන හා රාජපක්ෂ අතර පවතින තියුනු විරුද්ධත්වය මෙරට පාලක පන්තිය තුල පවතින ගැඹුරු බෙදීම් පෙන්නුම් කරයි. පසුගිය නොවැම්බරයේ රාජපක්ෂ ආන්ඩුවෙන් එලියට ආ සිරිසේන, ජනාධිපතිවරනයේදී රාජපක්ෂ පරාජය කලේය.

රාජපක්ෂ ඉවත් කිරීම සිදු වූයේ එක්සත් ජනපද ගැති එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහගේ හා හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ සහාය ඇතිව, වොෂින්ටනය සිදු කල තන්ත්‍ර-මාරු කිරීමේ මෙහෙයුමක් මගිනි. රාජපක්ෂ යටතේ ගොඩනැගුනු බීජිං - ශ්‍රී ලංකා සබඳතා බිඳ, චීනය මිලිටරිමය ලෙස වට කර පරාජය කිරීමේ අරමුන සහිත එක්සත් ජනපදයේ "ආසියාවට හැරීමේ" පිලිවෙත සමග මෙරට පෙලගස්වා ගැනීම සඳහා ඔබාමා පරිපාලනය අධිෂ්ඨානශීලීව සිටියේය.

නව වටයකින් බලය සඳහා ඔට්ටු වීමට රාජපක්ෂට දේශපාලන ගැම්ම ලැබුනේ, කම්කරුවන්ගේ ජීවන මට්ටම වැඩි දියුනු කිරීම හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැකීම ඇතුලුව සිරිසේන හා එජාපය මෙහෙයවන වත්මන් ආන්ඩුව කඩ කල පොරොන්දු රාශියක් පිලිබඳව පැතිර පවතින ජනතා අප්‍රසාදය මගිනි. විරෝධතාවයේ යෙදුන කම්කරුවන්ට, ශිෂ්‍යයින්ට හා දුගීන්ට එරෙහිව හමුදාව හා පොලීසිය බලමුලු ගැන්වීමට සිරිසේන-එජාප ආන්ඩුව පසුබට වූයේ නැත.

සිය පක්ෂය තුල සිරිසේනගේ බලය ගිලිහී යාම පැහැදිලිව අඟවුම් කරමින් විරුද්ධ පක්ෂයේ ශ්‍රීලනිප නායක නිමල් සිරිපාල ද සිල්වා අනුරාධපුර රැස්වීමේ දී කියා සිටියේ, රාජපක්ෂගේ නායකත්වය, පක්ෂයට මැතිවරනයේදී බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීම සහතික කරන බවයි. "ශ්‍රීලනිපයට ශක්තිමත් නායකයෙක් අවශ්‍ය බැවින් අප ඔබව අගමැති ලෙස නම් කරන බව" ඔහු කීවේය.

2009දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජය කිරීම පිලිබඳව සඳහන් කරමින් ශ්‍රීලනිප ප්‍රධාන ලේකම් අනුර ප්‍රියදර්ශන යාපා කියා සිටියේ, රට "ත්‍රස්තවාදයේ දඬු අඬුවෙන්" ගලවා ගැනීම පිලිබඳව රාජපක්ෂ හට තුති පිදිය යුතු බවයි.

"රටට පන දෙමු: අලුතින්ම පටන්ගමු" යන ශ්‍රීලනිප මැතිවරන සටන් පාඨය, ජීවන කොන්දේසි වලට පහර දීමේ හා පොලිස් රාජ්‍ය ක්‍රමෝපායයේ රාජපක්ෂ ආන්ඩුවේ වාර්තාව වහංගු කිරීමේ නරුම තැතකි.

තම නායකත්වය යටතේ ආන්ඩුව "නව විදේශ පිලිවෙතක් හා නව ආර්ථික දිශානතියක් ඔස්සේ ඉදිරියට යන්නේ" යයි රාජපක්ෂ රැස්වීම අමතා කීවේය.

ඔහුගේ "නව විදේශ පිලිවෙත" පිලිබඳව විස්තර නොකල ද රාජපක්ෂට හා ඔහුගේ සහචරයින්ට අවශ්‍යව ඇත්තේ, විශේෂයෙන්ම ආයෝජන හා ලාභ නය ලබා ගැනීමට, බීජිනය සමග ගොඩනගාගත් සමීප සබඳතාවය කරා ආපසු යාමටය. චීන ආයෝජන "යලිපිරික්සා බැලීම" හා "අවහිර කිරීම" පිලිබඳව අනෙක් රැස්වීම් වලදී රාජපක්ෂ විසින් සිරිසේන - වික්‍රමසිංහ ආන්ඩුව විවේචනය කරනු ලැබූ අතර චීනයෙන් ලැබෙන මූල්‍ය ආධාර ඉහල නංවන බවට සහතික විය.

2009 හා 2014 අතර රාජපක්ෂ ආන්ඩුව නය හා ආයෝජන ලෙස චීනයෙන් ඇ.ඩො. බිලියන 5ක මුදලක් ලබා ගත් බවට ගනන් බලා ඇති අතර එමගින් හිටපු ජනාධිපති, ඔහුගේ පවුල, දේශපාලන හිතවතුන් හා මහා ව්‍යාපාරික ගජ මිතුරන් වාසි ලැබීය. පාලක ප්‍රභූවේ මෙම කොටස් වලට අවශ්‍යව ඇත්තේ එම ක්‍රියා මාර්ගය ඉදිරියට ගෙන යාමයි.

ජනාධිපති ලෙස සිටි දස වසරක පාලන සමයේ මෙරට ආර්ථිකය සංවර්ධනය කල බවත්, දුගීන්ගේ සමාජ කොන්දේසි වර්ධනය කල බවත් රාජපක්ෂ කියා සිටියේය. "මගේ ආන්ඩුව මුලු රටටම විදුලි බලය හා ජලය ලබා දුන්නා මෙන්ම පාසැල්, රෝහල් ගොඩනගමින් නගර සංවර්ධනය කලා" යැයි ඔහු කියා සිටියේය.

මේවා අමු බේගල්ය. ක්‍රමානුකූල ලෙස අත්‍යවශ්‍ය භාන්ඩ මිල ඉහල දමමින් අත්‍යවශ්‍ය ජීවන කොන්දේසි මත පුලුල් ප්‍රහාරයක් මුදා හල රාජපක්ෂ ආන්ඩුව, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දෙමින් දිවයිනේ උතුරු නැගෙනහිර එල්ටීටීඊය ට එරෙහි යුද්ධය උත්සන්න කලේය.

2011 දී කටුනායක නිදහස් වෙලඳ කලාපය තුල වැඩවර්ජනය කල කම්කරුවන්ට එරෙහිව පොලිස් කොමාන්ඩෝ භටයන් යෙදූ රාජපක්ෂ ආන්ඩුව, කම්කරුවෙකු ඝාතනය කලේය. හලාවත ධීවරයන්ගේ උද්ඝෝෂනයකට කල පොලිස් පහර දීමේදී තවත් උද්ඝෝෂකයකු ඝාතනයට ලක්විය. පිරිසිදු ජලය ඉල්ලූ වැලිවේරිය නිවැසියන්ට හමුදාව වෙඩි තැබූ අතර එම ප්‍රහාරයේදී තරුනයන් තිදෙනෙක් ඝාතනයට ලක් විය.

ආන්ඩුව කෙරෙහි නැගෙමින් පැවති විරෝධය හමුවේ රාජපක්ෂ, සිය රෙජීමයට එරෙහි වාතාවරනය තවත් නරක අතට හැරීමට පෙර, වසර දෙකකට කලින් ජනාධිපතිවරනය පැවැත්වීමට තීන්දු කලේය. ඔහුගේ ආන්ඩුව නව යටිතල පහසුකම් හා ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා මාර්ගය විවෘත කලේය යන්න පිලිබඳව කීමට ඇත්තේ, එමගින් ආයෝජකයින්ට සුපිරි ලාභ ලැබුනු අතර සාමාන්‍ය ජනයාට අත්වූයේ සුලු ප්‍රයෝජනයක් පමනක් බවයි.

සිංහල වර්ගවාදය රාජපක්ෂගේ මැතිවරන උද්ඝෝෂනයේ ප්‍රධාන පදනම වන අතර එහි ඉලක්කය වන්නේ ඔහුගේ ආන්ඩුවේ සැබෑ වාර්තාව කෙරෙන් අවධානය වෙනතකට යොමු කිරීමය. සිංහල වර්ගවාදය ඇවිස්සීම, මෙරට පාලක පන්තියේ සෑම කන්ඩායමක්ම කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදීමට යොදා ගන්නා චිරාගත උපායකි.

පැරනි සිංහල රජවරුන්ගේ පලමු අග නගරය වූ අනුරාධපුරය එජනිසභි පලමු මැතිවරන රැස්වීම සඳහා තෝරා ගැනීම ද සිංහල වර්ගවාදයට ගැලපෙන පරිදි සිදු විය. රාජපක්ෂ සිය කථාව ඇරඹුවේ අනුරාධපුරය තෝරා ගත්තේ එය "විදේශ ආක්‍රමනිකයින් දන ගැස්සූ, සෞභාග්‍ය යුගයක් බිහි කල - අපේම ආර්ථික ක්‍රමයක් ගොඩ නගූ රාජධානිය අනුරාධපුරය" වූ බැවින් යැයි කියමිනි.

රාජපක්ෂ හා ඔහුගේ සහායකයන් චෝදනා කරන්නේ, සිරිසේන හා එජාප ආන්ඩුව "ජාතික ආරක්ෂාව" අවදානමට ලක් කර ඇති බවටය. "1978 සිට 2005 වනතෙක් මේ රටේ කොයි රාජ්‍ය නායකයාත් ත්‍රස්තවාදය ඉදිරියේ දන ගැහුවා. ප්‍රභාකරන් ඉදිරියේ දන ගැහුවා...අනෙක් දේශපාලනඥයන් වගේ මම මව්බිමට ද්‍රෝහි වෙලා නැහැ. මම ජනතාවට ද්‍රෝහි වෙලා නැහැ."

සෙනග අවුස්සමින් ද තමන් සිංහලයන්ගේ ආරක්ෂකයා ලෙස පෙනී සිටිමින් ද රාජපක්ෂ දිගටම කතා කලේයː "එදා කැලේ හබරල ගස් යට නිදාගත්ත අම්මල, දරුවො මෙතන ඉන්නවා. ආව ද මෙහාට සෙබලුන්ගෙ මල මිනී? ඔව් ගම් වලට ආවා."

යුද්ධය අවසන් කාලයේ ශ්‍රී ලංකා මිලිටරිය දහස් ගනනක් අහිංසක දෙමල මිනිසුන්, ගැහැනුන් හා ලමයින් ඝාතනය කලේය. රුදුරු මිලිටරි ප්‍රහාරයන්ගෙන් ඝාතනයට ලක්වූ සංඛ්‍යාව 40,000 ක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥයින් ගනන් බලා ඇත. එක්සත් ජනපදය හා අනෙක් අධිරාජ්‍යවාදී බලවතුන් මෙන්ම වත්මන් ජනාධිපති සිරිසේන හා ඔහුගේ එජාප සහචරයින්ද මෙම පිලිවෙත සම්පූර්නයෙන් වැලඳ ගත්තේය.

වොෂින්ටනය යුද්ධය හා ඊට සම්බන්ධිත මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳ සිය කනස්සල්ල පල කිරීම ආරම්භ කරනු ලැබුවේ රාජපක්ෂ ආන්ඩුවේ චීන සබඳතා බිඳීමට බලපෑම් දැමීම සඳහා පමනෙකි.

රාජපක්ෂ හා සිරිසේන කඳවුරු වලට රටෙහි විදේශ පිලිවෙතෙහි දිශානතිය පිලිබඳව වෙනස්කම් පැවතිය ද මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට කෙරෙන පහර දීම් දිගටම ගෙන යාම හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියෝග කරන්නාවූ කප්පාදු පිලිවෙත් පැටවීම පිලිබඳව ඔවුහු එකා මෙන් අධිෂ්ඨානවත්ව සිටිති.

සමාජවාදී සමානතා පක්ෂය (සසප), කොලඹ, යාපනය, හා නුවරඑලිය දිස්ත්‍රික්කයන්ට සිය අපේක්ෂකයින් ඉදිරිපත් කර තිබෙන අතර පාලක පන්තියේ සියලු කන්ඩායම් වලට විරුද්ධත්වය පල කරයි. කම්කරුවන්, තරුනයින් හා පීඩිත ජනතාව, ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ උවමනාකම් නියෝජනය කරන රාජපක්ෂ හා සිරිසේන කඳවුරු දෙකම ප්‍රතික්ෂේප කල යුතු අතර සසප උද්ඝෝෂනයට සහය දෙමින් පක්ෂයට බැඳී එහි සමාජවාදී හා ජාත්‍යන්තර ක්‍රියා මාර්ගය සඳහා අරගලයට උර දිය යුතුය.

© www.wsws.org